# ග්‍රාමීය පහළ ප්‍රාථමික සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනයේදී උද්ගත වී ඇති ගැටළු සහ ඊට පිළියම් පිළිබඳ අධ්‍යයනයක්

(කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2,3 වර්ගයේ පාසල් ඇසුරින්)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන ලද පෞද්ගලික නිබන්ධනයකි.

ජේ. ඇම්. බණ්ඩාරමැණිකා,
අධ්‍යාපනවේදී (විශේෂ) උපාධිය,
දෙවන පෙළ (ඉහළ),
93/M. PHIL/09

CR

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය.

471324

1996.08.25

UCLIB
471324

සංක්ෂේපයෙන් ............

මිනිසා වූ කලී විශ්වයේ සිටින අපූර්වතම සත්ත්වයෙකි. ඔහු තුළ ඇති සිතාසිමේ හැකියාවත්, භාෂාව භාවිතා කිරීමේ හැකියාවත් නිසා ඔහුට එම අපූර්වත්වය හිමි වී තිබේ. ඔහු ජන්මයෙන් ලබා ඇති මෙම ශක්‍යතාවය කායික, මානසික, බුද්ධි වර්ධනය මෙන්ම පරිණතිය සමඟ වර්ධනය වේ.

ප්‍රවේණියාණුවෙන් ලබා ඇති ආරම්ය සාධකය ඇතුලුත් මනෝ විද්‍යාත්මක සාධක, දරුවා හැදෙන වැඩෙන පරිසරය ඇතුලුත් සමාජ විද්‍යාත්මක හා පාරිසරික සාධක ද ආර්ථික සාධකද භාෂා වර්ධනය කෙරෙහි බලපායි. මෙම සාධක වාසි දායක වීමෙන් ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය වන අතර, අවාසිදායක වීමෙන් භාෂා ගැටළු ඇති කරවයි.

මෙලොව ජනිත වන දරුවා පරිණතියක් සමඟ මව ඇතුළු නිවෙස් පරිසරයෙන් හා පූර්ව පාසලෙන් ශ්‍රවණය හා කථන කුසලතා ලබා ගන්නා අතර කියවීම හා ලිවීම කුසලතා පාසල ඇතුළු විධිමත් අධ්‍යාපන කාරකයන් තුලින් වර්ධනය කර ගනී.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල ශිෂ්‍ය ජනගහනය ඉහතකී සාධකවල ප්‍රතිශේධාත්මක බලපෑම නිසා විවිධ ගැටළුවලට මුහුණ පාන බව පර්යේෂණ වලින් හෙළි වී ඇත. පර්යේෂිකාව විසින් දීර්ඝ කාලීන ව ග්‍රාමීය ප්‍රදේශවලින් ලබා ඇති අත්දැකීම් අනුව ද එම සිසු ගැටළු හඳුනාගෙන ඇත. එනිසා ම ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ශිෂ්‍ය ජනගහනය නියෝජනය වන පරිද්දෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පහළ ප්‍රාථමික සිසුන් නියැදිය ලෙස ගෙන මෙම පර්යේෂණය දියත් කරන ලදී.

මෙහි නියැදිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් අහඹු ක්‍රමයට තෝරා ගන්නා ලද සිසුන්ගෙන් 350 ක් එම පාසල්වල ගුරුවරුන් 25 ද, එම සිසුන්ගේ දෙමාපියන් 80 ද , ගුරු උපදේශවරුන් 03 ද තෝරා ගන්නා ලදී. මෙම නියැදිය ඇසුරෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල පහළ ප්‍රාථමික සිසුන් භාෂා කුසලතා වර්ධනයේ දී මුහුණපාන ගැටළු පිළිබඳ අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය.

මෙම අධ්‍යනයේදී භාෂා සංකල්ප හැඳින්වීමටත්, භාෂාවේ කාර්යයන් හා චතුර්විධ භාෂා කුසලතා වර්ධනය වන ආකාරය සහ භාෂා කුසලතා වර්ධනය සම්බන්ධ -යෙන් ගැටළු යන තේමාවන් ඔස්සේ භාෂා හැඳින්වීමට පළමු පරිච්ඡේදය වෙන් කෙරෙනි.

මීට පෙර කරණු ලද පර්යේෂණ අධ්‍යනයන් තුලින් භාෂා කුසලතා ගැටළු හා භාෂා කුසලතා වර්ධනයට අදාළ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රතිවේදයක් ලබාගත හැකි නිසාම දෙවන පරිච්ඡේදය පෙර සාහිත්‍ය විමර්ශනය සඳහා වෙන් කර ගන්නා ලදී.

පර්යේෂණ අරමුණු, පරීක්ෂණ ක්‍රම පිළිවෙත පිළිබඳ ව පැහැදිලි කිරීම සඳහා තුන්වන පරිච්ඡේදය වෙන්කර ගන්නා ලදී.

ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සාධන පරීක්ෂණ ආදී පර්යේෂණ උපකරණ යොදා ගනිමින් ලබා ගත් දත්තයන් විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයට සහ අවශ්‍ය තැන් හි ප්‍රතිශතක වගු සහ සංඛ්‍යා විද්‍යාත්මක ලෙස විශ්ලේෂණයට භාජනය කරන ලද්දේ සිව්වන පරිච්ඡේදයෙහි.

දත්ත විශ්ලේෂණය ලබාගත් කරුණු පදනම් කරගෙන භාෂා ගැටළු සම්බන්ධව නිගමනවලට එළඹීමටත්, ගැටළු අවම කර ගැනීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පස්වන පරිච්ඡේදය යොදා ගනිමින් පර්යේෂණ කාර්ය නිමකරන ලදී.